**කහටගස්දිගිලිය ප්‍රාදේශීය සභාව 2021**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කහටගස්දිගිලිය ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය/ ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය  සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන  ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.  පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට කහටගස්දිගිලිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය  තත්ත්වය  සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා  මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට  අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව  ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි  නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය

ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 3.7 ප්‍රකාරව ප්‍රාදේශීය සභාවක් පිළියෙල කළ අයවැය ලේඛනයක අයවැයගත තොරතුරු මූල්‍ය ප්‍රකාශනයේ ඉදිරිපත් කළයුතු වුවත් ප්‍රාදේශීය සභාව විසින් පිළියෙල කර තිබුණු වත්කම් හා වගකීම් ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය අයවැයගත තොරතුරු රහිතව ඉදිරිපත් කර තිබුණි. | පිළිගනිමි. | පළාත් පාලන ආයතන සඳහා වූ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළයුතු වේ. |
| (ආ) | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 15.8 වගන්තිය ප්‍රකාරව වාර්තා කරන දිනයේදී වර්ෂයකට වඩා අඩු ණය මුදල් ජංගම වගකීමක් ලෙස වර්ගීකරණය කළයුතු වුවත් දේශීය ණය සංවර්ධන අරමුදලට ගෙවිය යුතු රු.3,807,187 ක මුළු ණය ශේෂයම දිගු කාලීන ණය ලෙස දක්වා තිබුණි. | පිළිගනිමි. | පළාත් පාලන ආයතන සඳහා වූ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළයුතු වේ. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව දේපළ පිරියත හා උපකරණ මිලදී ගැනීම් රු.12,359,407 ක් වුවත් සමාලෝචිත වර්ෂයේ වත්කම් සඳහා එකතු කිරීම් රු.10,614,665 ක් ලෙස රු.1,744,742 ක් අඩුවෙන් දක්වා තිබුණි. | පිළිගනිමි. | නිවැරදි වටිනාකම් ගිණුම්ගත කළයුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණය හිමියන් වූ රු.13,454,545 ක් වත්කම් හා වගකීම් ප්‍රකාශයේ ජංගම වගකීමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | | |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සඳහන් සමාලෝචිත වර්ෂයේ ගැලපීම් රු. 11,616,174 ක් සඳහා ජ'නල් සටහන් හා උපලේඛන ඉදිරිපත් කර නොතිබුණි. | පිළිගනිමි | ගැලපීම් ලෙස දක්වා තිබුණු වටිනාකම හඳුනාගැනීමට කටයුතු කළයුතු වේ. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | කල් ඉකුත් වූ රු.88,314 ක්වූ කොන්ත්‍රාත් අතරුඳවුම් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 571 අනුව කටයුතු කරමි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුවේ. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 හි චක්‍රලේඛයේ 3.1 ඡේදය | සභාව සතු වාහන 04 ක ඉන්ධන දහන පරීක්ෂා කර නොතිබුණි. | ඉන්ධන පරීක්ෂාව සිදුකිරීමට කටයුතු කරමි. | චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකළ යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ අයහාරය ඉක්මවූ පුනරාවර්තන වියදම රු.7,583,201 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අයහාරය ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.31,852,800 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

**ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) වරිපනම් හා බදු** | | |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.2,067,249 ක්වූ හිඟ වරිපනම් සහ රු 410,078 ක් වූ කසළ බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි. | හිඟ වරිපනම් හා කසළ බදු අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. |

(ආ) **කුලී**

------

| | | | |
|---|---|---|---|
| | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.1,809,294 ක් වූ හිඟ කඩකුලී සහ රු. 1,572,165 ක්වූ ටෙන්ඩර් බදු කුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි. | හිඟ කඩකුලී සහ ටෙන්ඩර් බදු කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | කැලැනිකවැව වාපිකාරාම විහාරස්ථානයේ ඉදිරි සංවර්ධන කටයුතු සඳහා 2020 වර්ෂයේදී ලැබුණු රු.100,000 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිටද එම කාර්යයට හෝ විධිමත් අනුමැතියකින් අත්‍යවශ්‍ය වෙනත් සංවර්ධන කටයුත්තකට හෝ යොදවා ගැනීමෙන් තොරව පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | සොයා බලා කටයුතු කිරීමට සටහන් කර ගතිමි. | අරමුදල් උපයෝජනයට කටයුතු කළයුතු වේ. |
| (ආ) | NELSHIP ව්‍යාපෘතිය යටතේ කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ ව්‍යාපෘතියේ අතරුදවූම් මුදල වූ රු.3,577,076 ක් වර්ෂ දෙකකට වඩා වැඩි කාලයක් නිරවුල් නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | ආදායමට ගැනීමට කටයුතු කරමි. | නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනිමට කටයුතු කළයුතු වේ. |
| (ඇ) | සභාව සතු වටිනාකම රු.3,215,000 ක්වූ වාහන 08 ක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන වර්ෂය පුරා නිශ්කාර්යව පැවතුණි. | පිළිගනිමි | වාහන ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළයුතු වේ. |
| (ඈ) | 2020 මාර්තු 28 දිනැති අංක NCP/LG/DE/04/04/2020 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රාදේශීය සභාව සතු යන්ත්‍ර සහ වාහන කුලී පදනම මත ලබාදිය යුත්තේ ඒ සඳහා ගෙවිය යුතු ගාස්තුව අයකර ගැනීමෙන් පසුව වුවත් ප්‍රාදේශීය සභාවේ යන්ත්‍ර ඊට පටහැනිව මුදල් අයකර ගැනීමකින් තොරව ලබාදීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.625,742 ක් අයවී නොතිබුණි. | පිළිගනිමි | පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළයුතු වේ. |